# පින් ඇති සරසවි වරමක් දෙන්නේ

ශ්‍රී ලංකා සමාජයේ විවාහාපේක්ෂිතයන් බොහෝ දෙනෙකු විවාහ වීමටත් පෙර සිටම ඔවුන්ගේ ප්‍රධාන අරමුණ වී ඇත්තේ දරුවන්ට අධ්‍යාපනය ලබා දීම සඳහා ජනප්‍රිය පාසලක් සොයා ගැනීමයි. ඒ සඳහා උසස් පාසල් තෝරා ගැනීම සඳහා තිබෙන්නා වූ තරගකාරිත්වය ඔබ අපට සමාජය දෙස බැලීමෙන් අවබෝධ කර ගැනීමට පුළුවන. ඒ අනුව කසාද සහතිකයේ සිට පදිංචි සහතිකය දක්වා ලේඛන සකස් කරමින් තම දරුවාට සමාජය ඉදිරියේ බොරු කීමේ මුල්ම පාඩම දරුවා කුස තුළ සිටියදීම දෙමාපියන් විසින් ආරම්භ කරනු ලැබේ. දරුවා පෙර පාසලේ සිට අධ්‍යාපනය නමැති මඟ දිගේ ඇල්මේ දුවන ශිෂ්‍යයෙකු බවට පත් කර තිබෙන්නේ එම ශිෂ්‍යයාගේම ආදරණීය දෙමාපියන් විසිනි. මේ අනුව දෙමාපියන් තුළ තිබෙන්නා වූ සිහින දරුවන්ගෙන් ඉටු කර ගැනීමට දෙමව්පියන් උත්සාහ දැරීම විසින් දරුවා තුළ සිටින සැබෑ දක්ෂයා මතු වීම වළක්වමින් සහජ දක්ෂතා මුලිනුපුටා දමන්නේ සමාජය තුළ වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, ගණකාධිකාරිවරුන් වැනි රැකියා සම්බන්ධයෙන් සමාජය තුළ තිබෙන ආකල්ප නිසාය. ඛේදවාචකය ආරම්භ වන්නේ මෙතැනිනි.

පළමු වසරේ සිට උසස් පෙළ දක්වා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබා දෙන්නා වූ විෂය ක්ෂේත්‍රය තුළ කොටු වී ඉගෙන ගන්නා දරු දැරියන්ගෙන් 2%ක් පමණ සුළු පිරිසක් විශ්වවිද්‍යාල සඳහා තෝරා ගනු ලබයි. අවුරුදු 13ක් පාසල් ජීවිතය ගත කරන දරු දැරියන් උසස් පෙළින් පසු මඳක් නැවතී කල්පනා කර බැලූ විට ඔවුන් ඔවුන්ගේ ජීවිතය විවිධ විෂය ක්ෂේත්‍රයන් යටතේ කාල පරිච්ඡේදයෙන් කාල පරිච්ඡේදයට කියවීම, සවන්දීම තමන්ට මතකද කියා නැවත ලියා දැක්වීම පමණක් අවු 13ටම සිදු කර ඇති බව පෙනී යනු ඇත. ඒ නිසාම විචාරශීලී සහ ගවේෂණශීලී මිනිසෙකු නිර්මාණය වීමක් සිදු වී නැත.

රටේ ජනතාවගේ බදු මුදල්වලින් වැටුප් ලබන්නා වූ අධ්‍යාපන ක්ෂේත්‍රයට වගකිවයුතු සියල්ලන්ම මේ පිළිබඳ නැවත සිතා බැලිය යුතුව තිබේ.

කුඩා කාලයේ සිටම ලංකා අධ්‍යාපනය තුළ ප්‍රශ්න නොකරන්නන් හා එහෙයියන් ඉස්මතු කරන අතර, ප්‍රශ්න කරන්නන්, විවේචනය කරන්නන් පංති කාමරයේ පසුපස පේළියට ඉතා වේගයෙන් තල්ලු කරනු ලබන්නේ දිසාපාමොක් පරපුරේ නූතන භූමිකාව රඟපාන ආදරණීය ගුරු භවතුන් විසින්මය. එහෙත්, නූතන පාසල් අධ්‍යාපනය තුළ මෙම ක්‍රමය ක්‍රියාත්මක වන්නේ, ඉහළ නිලධාරීන්ගෙන් ලැබෙන ක්‍රමෝපායයන් කාලච්ඡේද ආශ්‍රයෙන් දරුවාගේ මනසට ඇතුළු කරලීමේ මෙහෙයුම ගුරුවරුන් කර මත පටවා තිබෙන නිසාය. ඒ නිසා මෙම තත්ත්වය ගුරුවරුන්ගේ කර මත පමණක් පැටවීම සාධාරණ නොවේ.

පාසල් විෂය ක්ෂේත්‍රය තුළ සිංහල, ඉංග්‍රීසි, විද්‍යාව ගණිතය වැනි විෂයයන්ට මූලික තැනක් ලබා දුන්නද පාසල් දරුදැරියන්ට අත්හදා බැලීම්, නව සොයා ගැනීම් කර ගැනීම සඳහා සුදුසු පාසල් වටපිටාවක් මෙන්ම දරුවාට සුදුසු මානසික වටපිටාවක් ශ්‍රී ලංකා අධ්‍යාපන සමාජය තුළ තිබේද යන්න ඉතා දැඩිව විමසා බැලීම වටී. එසේම උසස් යැයි පිළිගන්නා විශ්වවිද්‍යාල තුළ කලා, වාණිජ, වෛද්‍ය, ඉංජිනේරු වැනි උපාධි කඩදාසි ලබා දුන්නද, අවුරුදු හතරක් හෝ පහක් විශ්වවිද්‍යාල සමාජය තුළ සැරිසරමින් එළියට එන්නේ විශ්ව දැනුමින් සන්නද්ධ තරුණ විද්වතෙක්ද යන්න ගැටලුසහගතය. කටපාඩම් කිරීම, නිබන්ධන සැකසීම, මහාචාර්යවරයා දෙන පිළිතුරු ඒ ආකාරයෙන්ම ලිවීම ආදියෙන් ලබා ගන්නා උපාධි සහතිකය හා ලෝගුව තුළින් රටට, සමාජයට වැඩක් සිදුවේද?

ලංකා අධ්‍යාපන ක්ෂේත්‍ර තුළ වෙනස් විය යුතු නම් විය යුත්තේ මෙම සම්පූර්ණ ක්‍රියාදාමයයි. පෙර පාසල් අධ්‍යාපනයේ සිට විශ්වවිද්‍යාල අධ්‍යාපනය දක්වාම වෙනස් විය යුතුය.

ලංකා සමාජය තුළ නව නිර්මාණකරුවන් සහ නව සොයාගැනීම් සිදු කරන්නන්, හද්ද පිටිසර ගම් නියම්ගම්වල ඉස්මතු වී නිකරුණේ, විනාශ වී යන්නේ, අත දෙන්නට, නිසි මඟ පෙන්වන්නට ආයතනයක්, බලධාරියෙක් නොමැතිකම නිසාය. අත්ට්‍රැක්ටරය නිපදවූ ලාංකිකයා ජපානයට පේටන්ට් අයිතිය දෙන්නේද, මෑතකදී ඩෙංගු උවදුර සඳහා බෙහෙතක් සොයා ගත්තැයි මාධ්‍යයෙන් විශාල ප්‍රචාරයක් ලැබූ ඇල්පිටිය ප්‍රදේශයේ දේශීය වෛද්‍යවරිය අපේ රට කරවන ඇත්තන්ට මඟ ඇරෙන්නේත් ඉහත කාරණය නිසාය. නූතන අධ්‍යාපනය තුළ ප්‍රශ්න කිරීම නමැති නව අදහස් ගලා එන ප්‍රධාන සිදුර පාසල තුළින් මුලින්ම ලාකඩ තබා සීල් කරනු ලබන්නේ ආගම, සංස්කෘතිය, සදාචාරය නමැති මාර්ග බාධකවලට කොටු වුණු තරුණ පරපුරක් බිහි කිරීමට උචිත වන ලෙසටය.

ලංකාවේ තරුණයෙකු විසින් ගිනි අවියක් ඉතා සාර්ථක ලෙස නිපදවා, අත්හදා බලා තිබිණි. එය නීතියට අනුව දඬුවම් ලැබිය හැකි වරදක් බව සැබෑය. මිනිසෙකු නසන්නට වුවත් එම නිපයුම ඔහු ඉතා සාර්ථක ලෙස අත්හදා බලා තිබේ. ඔහු සතු දැනුම සමාජයේ මිනිසුන් නැසීම වෙනුවට සමාජයේ සංවර්ධනය වෙනුවෙන් යොදා ගැනීමට හැකියාව තිබේ. එහෙත්, සියල්ල කණපිට පෙරළමින් ඔහුට අවුරුදු 20කෘ සිර දඬුවමක් හිමි විය.

මෙවැනි ඛේදවාචක තුරන් කිරීමට නම්, සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමයෙන් මිදී, රාමුවෙන් පිට පැන සිටින තරුණ තරුණියන් ඔප් නංවා ගැනීම සඳහා මඟ පෙන්වා දීම මෙන්ම එම දක්ෂතා ඉහළට ඔසවා තබා ගැනීමේ විධිමත් ක්‍රමවේදයක් ලංකා සමාජය තුළ ඉස්මතු කළ යුතුව ඇත.

නමුත් ලංකාව තුළ වෙනස් විදියට සිතන වෙනස් මඟක් ගන්නා තරුණ තරුණියන්ට අත දෙනු නියා තමාගේ මනසේ වැඩ කරන නව අදහසක්, නව සොයා ගැනීමක් පිළිබඳව පැවසීමට කෙනෙක් සිටින්නේද හෝ තැනක් තිබේද යන්න පවා මඳක් සිතා බැලිය යුතුය. නමට පමණක් වාර්ෂිකව නව නිපයුම් පිළිබඳව හඳුන්වා දෙන වැඩසටහන් විවිධ අමාත්‍යාංශ මඟින් මහා මිල මුදල් යොදවා හඳුන්වා දුන්නද, තමන්ගේ මඩිය තර කර ගැනීම සඳහා පමණක් ප්‍රදර්ශනාත්මක ලෙස කටයුතු කරන නිලධාරීන් ලංකාව තුළ ඉහළ තනතුරුවල පුටු රත් කරමින් සිටින තාක් අද බිහි වන අංකුරයන් අනාගතයේ මහා ප්‍රාඥයන් වේ යයි සිතිය නොහැකිය.

ඒ නිසා ලංකාවේ සමස්ත අධ්‍යාපන ක්ෂේත්‍රයම ලෝකයේ නව ප්‍රවණතාවයන්ට ගැලපෙන පරිදි සහ ලාංකීය සමාජ අවශ්‍යතාවයන් තෘප්ත කරන පරිදි සකස් කිරීමෙන් තොරව මේ ගැටලුවට පිළියමක් ලැබෙන්නේ නැත. නිෂ්පාදන ක්‍රියාවලියක් සහ ඒ හා බැඳුණු අපනයන වෙනුවට විදේශීය ආයෝජකයන් පැමිණෙන තෙක් කට ඇරගෙන බලා සිටීමට අපට සිදු වී තිබෙන්නේද, ලංකාවේ සම්පත් පමණක් නොව ඉඩකඩම් ටිකද විදේශිකයන් විසින් අත්පත් කර ගනිද්දී හූල්ලන්නට මෙරට ජනතාවට සිදුව තිබෙන්නේද සංයුක්ත සැලසුමක් නොමැතිව සිදු කෙරෙන අධ්‍යාපනය විසින් ලංකාවට ගැලපෙන ආර්ථික සැලැස්මක කොටස්කරුවන් බවට පත් කිරීමට හැකි ප්‍රජාවක් නිර්මාණය කිරීමට එතෙක් මෙතෙක් පාලකයන් සැලසුම් නොකළ නිසාය. ඒ නිසා විය යුත්තේ රටක ආර්ථිකය විදේශීය ප්‍රාග්ධනය මත යැපීමෙන් තොරව ගොඩනඟා ගැනීමට හැකි ආර්ථික ක්‍රමයක් සහ ඒ සඳහා අවශ්‍ය බුද්ධිමතුන් සහ වෘත්තිකයන් බිහි කරන අධ්‍යාපන ක්‍රමයක් ඉක්මනින්ම ගොඩනැඟීමයි.

**සමීර කුලසිංහ/මාලිකා පැල්පොල**